# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1798/22 - 2013 පෙබරවාරි මස 19 වැනි අඟහරුවාදා - 2013.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* CI/1568/99.  නඩු අංකය : ඒ 3075 සහ

### කාර්මික ආරවුල් පනත 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2004.11.09 වැනි දිනැති හා අංක 1366/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2004.10.29 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 03, 22 වන පටුමග, අංක 03 හි පිහිටි ලංකා වෙළඳ කාර්මික සහ පොදු කම්කරු සංගමය (සී. එම්. යූ) හා අනෙක් පාර්ශ්වය වශයෙන් මොරටුව, ගොරකාන, ගාලු පාර හි පිහිටි රන්මල් හොලිඩේ රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.01.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 පෙබරවාරි මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : සී.අයි./1568/99

කාර්මික අධිකරණයේදීය

ලංකා වෙළඳ කාර්මික සහ පොදු
කම්කරු සංගමය (සී.එම්.යූ.)
අංක 03, 22 වන පටුමග,
කොළඹ 03.

පැමිණිලිකාර පාර්ශ්වය

රන්මල් හොලිඩේ රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ගාලු පාර, ගොරකාන,
මොරටුව.

සේවායෝජක වගඋත්තරකාර පාර්ශ්වය

ප්‍රදානය

01. කම්කරු සබඳතා සහ විදේශ රැකියා නියුක්ති අමාත්‍ය ආතාවුද සෙනෙවිරත්න මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල අංක 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2004 ඔක්තෝබර් මස 29 දිනැති නියෝගයෙන් මා පත්කර ඇත.

02. පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :-

"මොරටුව ගොරකාන පිහිටි රන්මල් හොලිඩේ රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි පාලක පක්ෂය විසින් මෙයට අමුණා ඇති උප ලේඛනයේ නම් සඳහන් සේවකයින් තිස්තුන් (33) දෙනාගේ සේවය අවසන් කිරීම යුක්ති සහගත ද යන්න හා නොඑසේනම් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව ද වේ."

03. මෙම ආරවුලට අදාලව පාර්ශ්වයන්ගෙන් ප්‍රකාශන ගොනු කිරීමට ද පෙර වගඋත්තරකාර සමාගම විසින් 2004.12.03 දිනැති පෙත්සමක් අංක 2386/04 යටතේ ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනා අධිකරණයේ හේතු කොටගෙන ගරු අභියාචනා අධිකරණය විසින් නිකුත් කරන ලද අතුරු ආඥාවක් නිසා පරීක්ෂණයේ සියළු වැඩ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. කෙසේ වෙතත් සේවා යෝජක වගඋත්තරකරු විසින් නැවත බේරුම්කාර අධිකරණයට යාමට කැමැත්ත පළකර සිටි බැවින් ගරු අභියාචනා අධිකරණය විසින් සේවායෝජක වගඋත්තකරුට පෙත්සම ඉල්ලා අස්කර ගැනීමට 04.05.2009 දිනැති නියෝගයෙන් අවසර දෙන ලදී. මෙම නියෝගය මත සේවාදායක වගඋත්තරකරු බේරුම්කරණ අධිකරණය ඉදිරියේ බේරුම්කරණ පරීක්ෂණයට සහභාගී විය.

05. ඉල්ලුම්කරුගේ පාර්ශ්වය විසින් බේරුම්කරණ පෙත්සමට අමුණා ඇති උපලේඛනයෙහි සේවකයින් තිස්තුන් (33) දෙනෙකු නම්කර තිබුණත් බේරුම්කරණ අධිකරණය ඉදිරියේ පෙනී සිටියේ පහත සඳහන් සේවකයින් තිදෙනා පමණි.

(1) කේ. එම්. කීර්තිරත්න ප්‍රනාන්දු (අංක 08)
(2) බී. එස්. තිලකසිරි හේවාආරච්චි (අංක 11) සහ
(3) පියනන්ද විජේසිංහ (අංක 19)

මේ අතර 2012.12.17 දින පරීක්ෂණයේ දී ඉහත සඳහන් සේවකයන්ගෙන් කේ. එම්. කීර්තිරත්න ප්‍රනාන්දුට රු.250,000/- ක්ද, බී. එස්. තිලකසිරි හේවාආරච්චිට රු.125,000/-ක්ද, පියනන්ද විජේසිංහට රු.75,000/-ක්ද, ගෙවීම මත උපලේඛනයේ සඳහන් ඉතිරි සේවකයන් 30 වෙනුවෙන් කිසිම ඉල්ලීමක් ඉදිරිපත් නොකරන බවට ඉල්ලුම්කාර පාර්ශ්වයේ නියෝජිත ඊ. වී. එන්. කබ්රාල් මහතා ද එකඟ විය.

06. මෙම කොන්දේසි ඇතුලත් 2012.12.31 දිනැති ලියවිල්ලක් 'X' වශයෙන් සලකුණු කොට බේරුම්කරණ නඩුවට ගොනු කරන ලද අතර ලංකා වෙළඳ සහ පොදු කම්කරු සංගමය (සී. එම්. යූ) වෙනුවෙන් ඊ. වී. එන්. කබ්රාල් මහතාත් මුදල් ලබාගත් බවට කේ. ඒ. කීර්තිරත්න ප්‍රනාන්දු, බී. එස්. තිලකසිරි හේවාආරච්චි සහ පියනන්ද විජේසිංහ මහතාත් වගඋත්තරකාර සමාගම වෙනුවෙන් හිටපු සභාපති රංජිත් පෙරේරා මහතාත් අත්සන් තබන ලදී. 2012.12.21 වන දින පරීක්ෂණ සටහන්වල ඉහත කරුණු ඇතුලත් කර ඇත.

ටී. පියසෝම,
බේරුම්කරු.

දිනය : 2013.01.03

*උපලේඛනය*

1. අනුර රාජපක්ෂලාගේ
2. ඩබ්. එම්. චම්මි අනුරුද්ධ
3. ඩබ්. පී. බන්දුසේන
4. එස්. ජී. ලාල් ප්‍රේමකුමාර චන්ද්‍රසේන
5. බී. ඒ. චන්ද්‍රසිරි
6. අයි. ඩී. ක්‍රිශාන්ත සන්ජීව
7. එම්. ජයන්ත දසනායක
8. කේ. ඒ. කීර්තිරත්න ප්‍රනාන්දු
9. ඩී. එම්. සනත් දසනායක
10. ඩබ්. බී. එම්. හරේන් ප්‍රනාන්දු
11. බී. එස්. තිලකසිරි හේවාආරච්චි
12. කේ. ඒ. අනුර කරුණාසේන
13. එම්. නිරෝෂන්
14. ජගත් නිශාන්ත
15. ජේ. දමිත් පද්මසිරි
16. ඩබ්. ඩී. ලක්මින් පෙරේරා
17. එම්. චමින්ද පීරිස්
18. ටී. රොහාන් කපිල පීරිස්
19. ප්‍රියනන්ද විජේසිංහ
20. කේ. ඒ. එච්. පියසේන
21. එච්. ජී. ජානක පුෂ්පකුමාර
22. චමින්ද නිශාන්ත රාජකුලතිලක
23. රංජිත් රණවංශ
24. ආර්. එම්. බන්දුල රත්නායක
25. ඩබ්. එම්. චමින්ද රත්නායක
26. පී. ජී. ආර්. සේනාරත්න
27. එච්. එම්. සිරිපාල
28. කේ. ජී. සුසන්ත
29. එස්. ඒ. බණ්ඩාර තිලකරත්න
30. ආර්. රොහාන් උපුල් තුෂාර
31. බී. වී. වසන්ත
32. ජී. ලලිත් වසන්ත කුමාරගේ
33. ටී. ජී. අජිත් ප්‍රියන්ත විජේරත්න

*Schedule*

1. Anura Rajapakshalage
2. W. M. Chammi Anuruddha
3. W. P. Bandusena
4. S. G. Lal Premakumara Chandrasena
5. B. A. Chandrasiri
6. I. D. Chrishantha Sanjeewa
7. M. Jayantha Dasanayake
8. K. A. Keerthirathna Fernando
9. D. M. Sanath Dasanayake
10. W. B. M. Haren Fernando
11. B. S. Thilakasiri Hewaarachchi
12. K. A. Anura Karunasena
13. M. Niroshan
14. Jagath Nishantha
15. J. Damith Padmasiri
16. W. D. Lakmin Perera
17. M. Chaminda Peiris
18. T. Rohan Kapila Peiris
19. Priyananda Wijesinghe
20. K. A. H. Piyasena
21. H. G. Janaka Pushpakumara
22. Chaminda Nishantha Rajakulathilaka
23. Ranjith Ranawansa
24. R. M. Bandula Rathnayake
25. W. M. Chaminda Rathnayake
26. P. G. R. Senarathna
27. H. M. Siripala
28. K. G. Susantha
29. S. A. Bandara Thilakarathne
30. R. Rohan Upul Thusara
31. B. V. Wasantha
32. G. Lalith Wasantha Kumarage
33. T. G. Ajith Priyantha Wijerathne

03 – 374

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.